1. සංඛ්‍යානයෙන් තොර ඕනෑම විද්‍යාවක් නිශ්ඵල වනවාක් මෙන්ම විද්‍යාවන්ගෙන් තොරව සංඛ්‍යානයටද පැවැත්මක් නැත.”මෙම ප්‍රකාශය විමසන්න.

2. 1.) සංඛ්‍යාතියෙහි ප්‍රධාන කාර්යයන් සැකෙවින් පැහැදිලි කරන්න.
   2.) සංඛ්‍යානයෙහි සීමාවන් මොනවාද?

3. පහත දැක්වෙන එක් එක් අවශ්‍යතාවයන් සපුරාලමින් දත්ත රූපිකව නිරූපණය කිරීමට වඩාත්ම යෝග්‍ය ක්‍රමය සඳහන් කරන්න.

1. ශාඛා 3ක් පවත්වා ගෙන යන සමාගමක මුළු වාර්ෂික ආදායම සංසන්දනාත්මකව නිරූපණය වන සේ වසර 5ක ආංශික ආදායම නිරූපණය කිරීමට.
2. එක් එක් ප්‍රවර්ගයෙහි සාපේක්ෂ වැදගත්කම නිරූපණය වන සේ සමාගමක සේවා නියුක්තිකයන් ප්‍රවර්ග 5ක් යටතේ වර්ග කර දැක්වීමට.
3. පසුගිය අවුරුදු 2 ½ තුළ කර්මාන්ත ශාලාවක මාසික නිමැවුම් ඒකක ගණන පෙන්වීමට.
4. පසුගිය අනුයාත වර්ෂ දෙක තුළ මාසික විකුණුම් ආදායම ත්‍රිමාණාකාරව විග්‍රහ කිරීම සඳහා
5. එක්තරා සමාගමක සාමාන්‍ය සේවා නියුක්තිකයෙක් හා එහි ගබඩා භාරකරු තම විවේක කාලය ගත කරන ආකාරය සංසන්දනාත්මකව දැක්වීම සඳහා.